ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2318/06 - 2023 පෙබරවාරි මස 06 වැනි වැනි සඳුදා - 2023.02.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ කොළොන්නාව නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අහිමිවීම හේතුකොට ගෙන කොළොන්නාව නගර සභාවට තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ කොළොන්නාව නගර සභාවට තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත් වූ විත්තුච් චාරිගේ සුරේෂ් කුමාර අයත් වන්නා වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂය නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම කොළොන්නාව නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා රත්නායක මුදියන්සේලාගේ සුදත් ප්‍රියන්කර නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

කොළොන්නාව නගර සභාවේ තේරීම්භාර නිලධාරී, මාපා මුදියන්සේලාගේ සේන කුමාරසිරි බණ්ඩාර මාපා වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් රත්නායක මුදියන්සේලාගේ සුදත් ප්‍රියන්කර කොළොන්නාව නගර සභාවට තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

**එම්. එම්. එස්. කේ. බණ්ඩාර මාපා,**
තේරීම්භාර නිලධාරී,
කොළොන්නාව නගර සභාව.

2023 පෙබරවාරි මස 03 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
කොළඹ.

EOG 02 - 0034

1A - G 38764 — 26 (2023/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ ගාල්ල මහ නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

පක්ෂ සාමාජිකත්වය අවසන් කිරීම හේතුකොට ගෙන ගාල්ල මහ නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1) වගන්තිය යටතේ ගාල්ල මහ නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස පත් වූ සංජීව ලක්මල් ජයවර්ධන අයත් වන්නා වූ එක්සත් ජාතික නිදහස් පෙරමුණ නම්වන පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයෙකු, සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගනු ලැබිය යුතු යැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූ ද, එම පක්ෂයට අයත් වන්නා වූ ද, එම ගාල්ල මහ නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා දොන් ජයසිරි සොන්නාදරගේ නිශාන්ත සංජීව නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

ගාල්ල මහ නගර සභාවේ තේරීම්භාර නිලධාරී, වේවැල්වල හේවගේ රවීන්ද්‍ර විජය කුමාර වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් දොන් ජයසිරි සොන්නාදරගේ නිශාන්ත සංජීව ගාල්ල මහ නගර සභාවේ තෝරා එවා ඇති සභිකයෙකු ලෙස මෙයින් ප්‍රකාශ කරමි.

**ඩබ්ලිව්. එච්. ආර්. විජය කුමාර,**
තේරීම්භාර නිලධාරී,
ගාල්ල මහ නගර සභාව.

2023 පෙබරවාරි මස 03 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
ගාල්ල.

EOG 02 - 0035

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.